සවියෙන් පෙරට - අපි එකට

e-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
7	භූගෝල විද්‍යාව	2	3. ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

සැකසුම: ඩබ්ලිව්. අයි. එස්. කුමාරි

බප/ හො/ පැල්පොල කනිෂ්ඨ විද්‍යාලය

ශ්‍රී ලංකාවේ භූ දර්ශනය

භූමිය මත ස්වභාවිකව පිහිටි (භෞතික) භූ දර්ශනයත් එහි මිනිසා විසින් ගොඩනගා ඇති (මානුෂ) භූ දර්ශනයත් එක්ව ගත් කල **භූ දර්ශනය** ලෙස හැඳින්වේ.

<u>භෞතික භූ දර්ශනය</u>

- තැනිතලා
- කඳු පන්ති
- ගංගා
- වෙරළ
- සානු
- දිය ඇලි

<u>මානුෂ භූ දර්ශනය</u>

- වගාබිම්
- කර්මාන්තශාලා
- නිවාස
- මාර්ග
- වැව්
- ජල යෝජනා ක්‍රම

- ශ්‍රී ලංකාවේ සමස්ථ භූ දර්ශනය ප්‍රාදේශීය විවිධත්වයක් පෙන්නුම් කරයි
- ඒ අනුව ශ්‍රී ලංකාව ප්‍රධාන කලාප පහකට බෙදා ඇත.

1. කඳුකර භූ දර්ශනය
2. වියලි කලාපීය භූ දර්ශනය
3. තෙත් කලාපීය භූ දර්ශනය
4. යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනය
5. වෙරළ ආශ්‍රිත භූ දර්ශනය

ශ්‍රී ලංකාවේ සමස්ථ භූ දර්ශනය



3.1 රූපය - ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය භූ දර්ශනයේ විවිධත්වය

කඳුකර භූ දර්ශනය

මෙම භූ දර්ශනය දැකගත හැක්කේ මුහුදු මට්ටමේ සිට 300m ට වඩා උසින් යුක්ත බිම් වලය.

- මධ්‍යම කඳුකරය
- සබරගමු කඳුකරය ආශ්‍රිත ප්‍රදේශ

කඳුකර භූ දර්ශනය තුළ කැපී පෙනෙන භෞතික ලක්ෂණ

1. කඳු වැටි

- පටු දිගටි හැඩයකින් යුත් මුදුන් කිහිපයකින් සමන්විත උස් ප්‍රදේශයක් කඳුවැටියක් ලෙස හැඳින්වේ.

(මධ්‍යම කඳුරයේ ප්‍රධාන කඳු පන්ති හතරකි)

- ✓ නකල්ස් කඳු පන්තිය
- ✓ පිදුරුතලාගල කඳු පන්තිය
- ✓ සමනල කඳු පන්තිය
- ✓ හපුතලේ නමුණුකුල කඳු පන්තිය



2. සානු

- උස් සම භූමිය සානුවක් ලෙස හැඳින්වේ.
    - ✓ වැලිමඩ සානුව
    - ✓ මහනුවර සානුව
    - ✓ මහනුවර සානුව
    - ✓ හැටන් සානුව
    - ✓ හොර්ටන් තැන්න සානුව
    - ✓ මහවලතැන්න සානුව
    - ✓ කොස්ලන්ද සානුව



3.කපොලු

- උස් කඳු අතර පිහිටි පහත් බිම් කපොලු හෙවත් දුර්ග ලෙස හැඳින්වේ.

✓ ගලගෙදර කපොල්ල
✓ ගිනිගත්හේන කපොල්ල
✓ බලන කපොල්ල
✓ ඇල්ල කපොල්ල
✓ මාතලේ බලකඩුව කපොල්ල
✓ හපුතලේ කපොල්ල



4.දිය ඇලි

- කඳු මුදුන් වලින් ආරම්භ වන ගංගා සානු ඔස්සේ ගමන් කිරීමේදී උස මට්ටමක පිහිටි සානුවකින් පහත් මට්ටමේ පිහිටි සානුවකට ගංගාව පිවිසීමේදී එකවර පහතට ඇද හැලේ. එබඳු ස්ථානවල දිය ඇලි සෑදී ඇත.

- ✓ දුන්හිඳ ඇල්ල
- ✓ රම්බොඩ ඇල්ල
- ✓ බඹරකන්ද ඇල්ල
- ✓ බේකර්ස් ඇල්ල
- ✓ ලක්ෂපාන ඇල්ල
- ✓ ඩෙවෝන් ඇල්ල
- ✓ සෙන්ට් ක්ලෙයාර් ඇල්ල
- ✓ රාවණා ඇල්ල



5. භූවිෂමතාවයට හා දේශගුණයට අනුකූලව දේශගුණයට අනුකූලව වැඩුණු වෘක්ෂලතා වැස්ම

කඳුකර භූ දර්ශනය තුළ කැපී පෙනෙන මානුෂ ලක්ෂණ

❖ තේ වගාව සහ ඒ හා බැඳුණු වතු ජනාවාස

❖වාණිජ එළවළු, පලතුරු සහ මල් වගාව

❖කඳු බෑවුම් වල නිවාස

❖වංගු සහිත දියුණු මාර්ග පද්ධතිය

❖සත්ව පාලනය

❖සංචාරක කර්මාන්තය, විනෝදය සහ ක්‍රීඩා

වියළි කලාපීය භූ දර්ශනය

- මෙම භූ දර්ශනය පවතින ප්‍රදේශ,

  - ❖ උතුරු ප්‍රදේශය
  - ❖ උතුරු මැද ප්‍රදේශය
  - ❖ නැගෙනහිර ප්‍රදේශය
  - ❖ සහ ගිනිකොණදිග ප්‍රදේශය

- ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ටාචාරය ආරම්භ වූ ප්‍රදේශ වේ.



3.3 රූපය - ශ්‍රී ලංකාවේ වියළි කලාපීය භූ දර්ශනය

වියළි කලාපීය භූ දර්ශනය තුළ කැපී පෙනෙන භෞතික ලක්ෂණ

- පුළුල් තැනිතලා

- දැඩි උෂ්ණත්වය හා ඉහළ වාෂ්පීකරණය

- කුඩා හෙල්වැටි

- උස් කඳන් හා තද අරටු සහිත ගස්වලින් යුත් වනාන්තර

- ශේෂ කඳු



- සෘතුමය ගංගා

- තෘණ පඳුරු සහ කටු පඳුරු සහිත ලඳු කැලෑ

(මන්නාරම, පුත්තලම, හම්බන්තොට වැනි ශුෂ්ක ප්‍රදේශ වල)

වියළි කලාපීය භූ දර්ශනය තුළ කැපී පෙනෙන මානුෂ ලක්ෂණ

- වී වගාව හා සහල් ආශ්‍රිත කර්මාන්ත

- හේන් ගොවිතැන

- මහවැලි ජනාවාස
- වාරි කර්මාන්තය

- වනාන්තර හා අභය භූමි

➢ ආගමික ස්ථාන

ශ්‍රී මහා බෝධිය

ත්‍රිකුණාමලයේ
කෝනේශ්වරම් කෝවිල

ඉස්ලාම් ආගමික
දේවස්ථානය

කතරගම දේවාලය

➢ පුරාණ රාජධානිවල නටබුන්

➢ සංචාරක කර්මාන්තය

වියළි කලාපය තුළ නිර්මාණය කර ඇති ජලාශ හා වැව්,

කලා වැව
රාජාංගනය වැව
නාච්චදුව වැව
මින්නේරිය වැව
පරාක්‍රම සමුද්‍රය
සේනානායක සමුද්‍රය
උඩවලව ජලාශය
මාදුරුඔය ජලාශය
ලුණුගම්වෙහෙර ජලාශය



3.3 රූපය - ශ්‍රී ලංකාවේ වියළි කලාපය හි දර්ශනය

තෙත් කලාපීය භූ දර්ශනය

මෙම භූ දර්ශනය පවතින ප්‍රදේශ,

- ශ්‍රී ලංකාවේ නිරිත ප්‍රදේශ
- බටහිර ප්‍රදේශ
- මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශ



3.4 රූපය - ශ්‍රී ලංකාවේ තෙත් කලාපීය භූ දර්ශනය

තෙත් කලාපීය භූ දර්ශනය තුළ කැපී පෙනෙන භෞතික ලක්ෂණ,

❖තැනිතලා

❖හෙල්වැටි

❖ගංගා

❖වගුරු බිම්

❖සාරවත් වෘක්ෂලතා වැස්ම

❖ජෛව විවිධත්වය

තෙත් කලාපීය භූ දර්ශනය තුළ කැපී පෙනෙන මානුෂ ලක්ෂණ,

- ❑ කැලණි ගංගාවේ පිටාර තැනි ආශ්‍රිතව එළවළු සහ කොරටු වගාව
- ❑ වෙරළාශ්‍රිතව පොල් වගාව
- ❑ ගංගා නිම්න වල වී වගාව
- ❑ කඳු බෑවුම්වල රබර් සහ තේ වගාව
- ❑ කටුනායක, කොග්ගල, බියගම ප්‍රදේශවල නිදහස් වෙළඳ කලාප බිහිවීම
- ❑ රත්මලාන, ඒකල නගර ආශ්‍රිතව කාර්මික ජනපද ඇති වීම
- ❑ භූමි ප්‍රමාණය සීමිත බැවින් සිරස් අතට ඉදිවූ තට්ටු ගොඩනැගිලි (රෝහල්, පාසල්, බැංකු පොලිස් යනාදිය සහ සාප්පු සංකීර්ණ නිවාස සංකීර්ණ)

තෙත් කලාපය තුළ දක්නට ලැබෙන සුවිශේෂී වූ ලක්ෂණ,

- සීඝ්‍රයෙන් දියුණු වන සැලසුම් සහගත නගර
- නගර හා ග්‍රාමීය ප්‍රදේශ මිශ්‍ර වූ භූ දර්ශනය
- අධික ජනගහනය
- සංවර්ධනය වූ මාර්ග පද්ධති (අධිවේගී මාර්ග, ගුවන් පාලම්, දුම්රිය මාර්ග)
- ශ්‍රී ලංකාවේ පරිපාලන නගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සහ වාණිජ නගරය වන කොළඹ මෙම කලාපය තුල පිහිටීම
- නාගරික කාර්මික සේවා හා මධ්‍යස්ථාන ලෙස වැදගත් වන කොළඹ ,ගාල්ල මීගමුව, මහනුවර, කළුතර වැනි නගර පිහිටීම

මෙම ප්‍රදේශයේ පවතින ගැටළු

- ❑ නායයාම්
- ❑ භූගත ජල උල්පත් සිඳී යාම
- ❑ ගොඩනැගිලි ගිලා බැසීම්
- ❑ මැසි මදුරුවන් බෝවීම

ගැටළු ඇතිවීමට බලපාන හේතු

- ❑ මැටි කැපීම
- ❑ මැණික් ඉල්ලම් අසීමිත ලෙස හැරීම
- ❑ අසීමිත ලෙස ගංගාවලින් ඉවත් කිරීම
- ❑ වන විනාශය
- ❑ පරිසරයට හානිකර වූ සංවර්ධන කටයුතු

යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනය

- යාපනය අර්ධද්වීපය යනු ශ්‍රී ලංකාවේ උතුරු පලාතේ ප්‍රදේශයකි. මෙම ප්‍රදේශය ජලයෙන් වටවී ඇති අතර සිහින් බිම් තීරුවකින් ශ්‍රී ලංකාවේ ඉතිරි ප්‍රදේශ හා සම්බන්ධ වේ.

- මෙම අර්ධද්වීපය ආශ්‍රිතව නාගදීපය හා කයිට්ස් දූපත් දක්නට ලැබේ.


භෞතික ලක්ෂණ
වැලිතලා
සාරවත් රතු පස
භූගත ජලය
හුණුගල් පස
දූපත්
කලපු
තැනිතලා බිම්


මානුෂ ලක්ෂණ
කෘෂිකර්මාන්තය
ධීවර කර්මාන්තය
ලුණු කර්මාන්තය
තල් ගස ආශ්‍රිත ආහාර හා භාණ්ඩ නිපදවීම
සංචාරක කර්මාන්තය
හස්ත කර්මාන්ත
හෝටල් කර්මාන්තය

දේශගුණික තත්ත්වය

- අඩු වර්ෂාපතනය
- අධික උෂ්ණත්වය
- අධික වාෂ්පීකරණය
- ප්‍රධාන වර්ෂාපතන ක්‍රම මගින් වැසි නොලැබීම

ආකර්ෂණීය ස්ථාන

- නයිනතිව් දූපත්
- කෝනේශ්වරම් දේවාලය
- යාපනය පුස්තකාලය හා වරාය
- චුන්ඩිකුලම් කුරුළු අභය භූමිය
- දඹකොල පටුන

දඹකොළ පවුන
පින් බිම

6.ආඩියා ළිඳ

වෙරළ ආශ්‍රිත භූ දර්ශනය

- ශ්‍රී ලංකාව වටා ඇති සම්පූර්ණ වෙරළ තීරය මෙම භූ දර්ශනයට අයත්ය



3.6 රූපය - ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත භූ දර්ශනය

භෞතික භූ දර්ශනය

දූපත්

බොකු

තුඩු

කලපු

කොරල් පර

වැලිතලා

කඩොලාන ශාක පද්ධති

වගුරු

මානුෂ භූ දර්ශනය

සංචාරක කර්මාන්තය

ධීවර කර්මාන්තය

ධීවර ජනාවාස

ලුණු කර්මාන්තය

කොහු ආශ්‍රිත කර්මාන්තය

හුණු ගල්කර්මාන්තය

වැලි ගොඩ දැමීම

කරවල වේලීම

වෙරළ තීරයේ ඇති ආකර්ෂණීය ස්ථාන

ප්‍රදීපාගාර

පුරාවිද්‍යාත්මක ස්ථාන

කොරල් පර

හෝටල්

දර්ශනීය වෙරළ තීර

සවියෙන් පෙරට - අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
7	භූගෝල විද්‍යාව	**2**	**3. ශ්‍රී ලංකාවේ භූ දර්ශනය - ඇගයීම**

සැකසුම: ඩබ්ලිව්. අයි. එස්. කුමාරි
බප/ හො/ පැල්පොල කනිෂ්ඨ විද්‍යාලය

1. ශ්‍රී ලංකාවේ වර්ග ප්‍රමාණය කීයද?
2. භූ දර්ශනය යනු කුමක්ද?
3. ශ්‍රී ලංකාවේ කඳුකර භූ දර්ශනය දැකිය හැකි ප්‍රදේශ මොනවාද?
4. කඳුකර භූ දර්ශනයේ දැකිය හැකි භෞතික ලක්ෂණ හතරක් නම් කර, උදාහරණ දෙක බැගින් සපයන්න.
5. කඳුකර භූ දර්ශනයේ දැක ගත හැකි මානුෂ කටයුතු පහක් නම් කරන්න.

හිස්තැන් පුරවන්න

6. උතුර, උතුරු මැද, ... සහ ගිණිකොණ දිග ප්‍රදේශවල වියළි කලාපීය භූ දර්ශනය දැක ගත හැකිය.
7. දැඩි නියගය, අධික උෂ්ණත්වය, ..., ඉහළ වාෂ්පීකරණය වැනි සාධක මත වියලි කලාපීය භූ දර්ශනයේ පදනම සැකසී ඇත .
8. සීගිරිය, දඹුල්ල, රිටිගල, කතරගම මෙම කලාපයේ පිහිටි .....ය.
9. වර්ෂා ජලය සහ .....ගංගාවේ ජලය මගින් මෙම වියළි කලාපයේ බොහෝ වැව් සංඛ්‍යාවක් පෝෂණය වේ.
10. .....වියළි කලාපීය භූ දර්ශනයෙන් ක්‍රමයෙන් වෙනස් වීගෙන යන ලක්ෂණයකි.

11. ගැලපෙන පද යා කරන්න

තෙත් කලාපයේ ගංගාවකි	රත්මලාන
එළවළු සහ කොරටු වගාව	ජයවර්ධනපුර කෝට්ටේ
වෙළෙඳ කලාපය	කොළඹ
කාර්මික නගර	කළු ගඟ
ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර	කැලණි ගඟ පිටාර තැනි
වාණිජ නගරය	බියගම

12. තෙත් කලාපයේ සජීවී භූ දර්ශනය ඇතිවීම කෙරෙහි බලපා ඇති හේතු දෙකක් ලියන්න.
13. තෙත් කලාපයේ පැන නැගී ඇති පාරිසරික ගැටළු හතරක් නම් කරන්න.
14. යාපනය අර්ධද්වීපය හා දූපත් ආශ්‍රිත භූ දර්ශනයේ දක්නට ලැබෙන දූපත් දෙකක් නම් කරන්න.
15. මෙම කලාපයේ දක්නට ලැබෙන භෞතික ලක්ෂණ තුනක් ලියන්න.
16. යාපනය අර්ධද්වීපය හා දූපත් ආශ්‍රිත භූ දර්ශනයේ දක්නට ලැබෙන මානුෂ කටයුතු තුනක් ලියන්න.
17. මෙම භූ දර්ශනයේ දක්නට ලැබෙන සංචාරක ආකර්ෂණයට ලක්වූ ප්‍රදේශ දෙකක් නම් කරන්න.
18. වෙරළ ආශ්‍රිත භූ දර්ශනයේ දැකිය හැකි භෞතික ලක්ෂණ පහක් ලියන්න.
19. මෙම කලාපයේ දක්නට ලැබෙන මානුෂ කටයුතු තුනක් නම් කරන්න .
20. ශ්‍රී ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කොට, නම් කරන්න.

කොළඹ, මන්නාරම, ත්‍රිකුණාමලය, පාසිකුඩා, චුන්ඩිකුලම කුරුලු අභය භූමිය, ගාල්ල, පේදුරුතුඩුව ,නාගදීපය

සවියෙන් පෙරට - අපි එකට

e - ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය	විෂයය	වාරය	පාඩම
7	**භූගෝල විද්‍යාව**	**2**	**3. ශ්‍රී ලංකාවේ භූ දර්ශනය - පිළිතුරු**

සැකසුම: ඩබ්ලිව්. අයි. එස්. කුමාරි
බප/ හො/ පැල්පොල කනිෂ්ඨ විද්‍යාලය

1. වර්ග කිලෝමීටර් 65610
2. භූමිය මත ස්වභාවිකව පිහිටි (භෞතික) භූ දර්ශනයත් එහි මිනිසා විසින් ගොඩනගා ඇති (මානුෂ) භූ දර්ශනයත් එක්ව ගත් කල **<u>භූ දර්ශනය</u>** ලෙස හැඳින්වේ.
3. මුහුදු මට්ටමේ සිට 300m ට වඩා උසින් යුක්ත බිම් වල දැකිය හැක. මධ්‍යම කඳුකරය, සබරගමු කඳුවැටිය.
4. **කඳු වැටි** - නකල්ස් කඳු වැටිය, පිදුරුතලාගල කඳු වැටිය/ සානු -හෝර්ටන්තැන්න , හැටන් සානුව **කපොලු** -ගලගෙදර කපොල්ල, මාතලේ බලකඩුව කපොල්ල /දිය ඇලි- දුන්හිඳ දිය ඇල්ල, බඹරකන්ද දිය ඇල්ල
5. තේ වගාව, වාණිජ එළවළු, පලතුරු සහ මල් වගාව, සත්ත්ව පාලනය, සංචාරක කර්මාන්තය
6. නැගෙනහිර
7. අඩු වර්ෂාපතනය
8. ශේෂ කඳු
9. මහවැලි
10. හේන් වගාව
11. තෙත් කලාපයේ ගංගාවකි - කළු ගඟ

    එළවළු සහ කොරටු වගාව - කැලණි ගඟ පිටාර තැනි

    වෙළෙඳ කලාපයකි - බියගම

    කාර්මික නගරයකි - රත්මලාන

    ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර - ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

    වාණිජ නගරය - කොළඹ

12. තෙත් කලාපයේ නගර වලින් දෛනික සේවාවන් ලබා ගැනීමට දෛනිකව පැමිණෙන අධික ජන සංඛ්‍යාව සහ රථ වාහන සංඛ්‍යාව

13. නායයාම්, භූගත ජල උල්පත් සිඳී යාම, ගොඩනැගිලි ගිලා බැසීම්, මැසි මදුරුවන් බෝවීම

14. නාගදීපය, කයිට්ස්....

15. තැනිතලා බිම්, කලපු , දූපත් , හුණුගල් පස, භූගත ජලය

16. තල් ගස ආශ්‍රිත නිෂ්පාදන, ලුණු නිෂ්පාදනය, ධීවර කර්මාන්තය, හස්ත කර්මාන්තය, සංචාරක කර්මාන්තය, එලවලු වගාව

17. චුන්ඩිකුලම් කුරුළු අභය භූමිය, නැගෙනහිර වෙරළ තීරය, නාගදීපය

18. දර්ශනීය වෙරළ තීරය, කලපු, වගුරු, කඩොලාන ශාක පද්ධති

19 . ආගමික සිද්ධස්ථාන, අභය භූමි, හුණුගල් කර්මාන්තය, ධීවර කර්මාන්තය ප්‍රදීපාගාර

20 .



3.6 රූපය - ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත භූ දර්ශනය